# පුංචි මියුලගෙන් අපමන් පාඩමක්



අශ්මි මෙතුසරි බණ්ඩාර

# පුංචි මියුලගෙන් අපටත් පාඩමක්

ප්‍රථම එළිදැක්වීම - 2025.02.08
ISBN No : 978-624-208-780-1

අශ්මි මෙතුසරි බණ්ඩාර

# පිදුම

මෙම පොත
මගේ ගුරු මෑණිවරුන්ට
හා පියවරුන්ට
පුදමු.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකමත් එක කාලෙක මියුල කියලා පුංචි ළමයෙක් ලස්සන පුංචි ගෙදරක ජීවත් වුණා. මියුල වයස අවුරුදු තුනේදි රිය අනතුරකට ලක්වුනා. ඒකෙන් මියුලගේ එක කකුලක් කැඩුණා. ඒක නිසා මියුලට ඇවිදින්න බැහැ. මියුල ගොඩක් දවසට ඉන්නේ ඇඳේ, ජනේලයෙන් එළිය බලාගෙන.



හැමදාම වගේ මියුලගේ ගෙදර ඉස්සරහින් සෙල්ලම් කරන්න යන යාළුවෝ දැකලා මියුලට දුක හිතුණා. ඒක දැකපු යාළුවන්ටත් දුක හිතිලා මියුලගේ අම්මට කිව්වා මියුලව පුටුවක ඉන්දවලා එළියෙන් තියන්න කියලා. ඊට පස්සේ මියුලට සතුටු හිතුණා. මියුලට දුවන්න පනින්න බැරි නිසා එයාගේ යාළුවෝ කළේ මියුලටත් කරන්න පුළුවන් සෙල්ලම් විතරයි.



ටික දවසක් ගත වෙද්දි යාළුවන්ට හිතුණා මියුලව නැගිට්ටවන්න. යාළුවෝ හැමෝම කතාවෙලා මියුලව දෙපැත්තෙන් අල්ලාගෙන නැගිට්ටෙව්වා. මියුලටත් මියුලගේ දෙමාපියන්ටත් හරිම සතුටුයි.

හැමදාම හවසට සෙල්ලම් කරන්න එන යාළුවෝ මියුලව නැගිට්ටවන නිසා මියුලට කකුල් ටික ටික සොලවන්න පුළුවන් වුණා.



මියුලට හිටපු යහළුවන්ගෙන් දෙන්නෙක්ගේ තාත්තලා ව්‍යාපාරිකයෝ. ඉතින් ඒ පුංචි යාළුවෝ දෙන්නා තාත්තලාට මියුල ගැන කිව්වා. ඊට පස්සේ ඒ දෙන්නා එකතුවෙලා මියුලට රෝද පුටුවකුත් ගෙනත් දුන්නා. මේක දැකපු මියුලට හරිම සතුටුයි. මියුල හැමදාම යාළුවොත් එක්ක සෙල්ලම් කරද්දී රෝද පුටුවේ ඉඳගෙන සතුටින් සෙල්ලම් කරනවා. මේක දැකපු මියුලගේ අම්මට සතුටට කඳුළුත් ආවා. මියුල දැන් පාසල් යනවා. එයා ඉගෙන ගන්නේ එක ශ්‍රේණියේ හැබැයි මියුල යන්නේ රෝද පුටුවේ. මියුල පාසල් වැඩ කටයුතුත් හොඳට කරගෙන ගියා. ඒ නිසා ගුරුවරුත් මියුලට හරිම ආදරෙයි.මියුලත් පුළුවන් විදිහට යාළුවන්ටත් උදව් කරනවා. යාළුවොත් මියුලට ඒ නිසා ගොඩක් කැමතියි.




ඔහොම ටික දවසක් යද්දි මියුලට හිතුණා තනියම නැගිටින්න. මියුල කොහොමහරි තමන් ළඟ තිබුණු බිත්තියට අත තියලා නැගිටින්න හැදුවා. පළවෙනි පාර නැගිටින්න හදද්දී එයා වැටුණා. මේක දැකපු මියුලගේ අම්මාටත් දුක හිතිලා මියුලට නැගිටින්න උදව් කළා. මියුල ආයෙමත් වැටුණා. ඒත් එයා එයාගේ උත්සාහය අතහැරියේ නම් නැහැ. ටික දවසක් ගත වෙද්දී මියුල එදා වගේම බිත්තිය අල්ලාගෙන නැගිටින්න හැදුවා. මියුල ආයෙමත් වැටුණා. ඒත් මියුල හිතේ ධෛර්යය අරගෙන "වැටිලා තුවාල වුනත් කමක් නෑ" කියලා නැගිට්ටා. මියුලට නැගිටින්න පුළුවන් වුණා ! බිත්තිය අල්ලන් හිටපු නිසා අත ගත්තත් මියුල වැටුණේ නම් නැහැ ! මියුලට හරිම සතුටුයි.





මියුල හෙමින් හෙමින් ඇවිදගෙන අම්මා ළඟට ගියා. මේක දැකපු අම්මට සතුට වැඩිවෙලා කඳුළුත් ආවා. අම්මා මියුලව බදා ගත්තා. අනෙක් දවසේ මියුලත් එක්ක සෙල්ලම් කරන්න ආව යාළුවෝ මියුල දැකලා පුදුම වුණා. යාළුවෝ ගොඩක් සතුටුවෙලා මියුලව බදා ගත්තා. දැන් මියුල හැමදාම යාළුවොත් එක්ක හවසට සෙල්ලම් කරන්න යනවා. හැබැයි මේ සැරේ ගියේ රෝද පුටුවෙන් නෙමෙයි.





මියුල සතුටින් උඩ පැන පැන යාළුවෝ අල්ලන්න දුවනවා. මේක දැකපු පන්තියේ ගුරුතුමාත් මියුල ගැන ගොඩක් සතුටු වෙනවා. මේ අතරේ මියුල පාසල් වැඩත් හොඳින් කරගෙන යනවා. ඒක නිසා මියුල මුළු පාසලේම ප්‍රශංසාවට ලක් වෙනවා. මෙහෙම ටික දවසක් යද්දි මියුලට අනෙක් යාළුවන්ට වඩා හොඳින් දුවන්න පුළුවන් වෙනවා. මියුල දැන් පාසලට යන්නෙත් පයින්, සමහර දවසට මියුලගේ යාළුවෝ මියුලගේ ගෙදර ළඟම තියෙන ගඟේ නාන්න යනවා.

මියුලට දැන් හොඳට ඇවිදින්න පුළුවන් නිසා යාළුවෝ මියුලවත් ගඟට එක්කර ගෙන ගියා. ඊට පස්සේ මියුලට පීනන්නත් කියලා දුන්නා. මෙහෙම ටික දවසක් යද්දි මියුලට හොඳට පීනන්නත් පුළුවන් වුණා. ඊට පස්සේ මියුල හැම අතකින්ම දක්ෂයෙක් වෙනවා. යාළුවෝ හවසට සෙල්ලම් කරන්න එද්දී මියුලත් යාළුවොත් එක්කම ගිහින් ගඟේ සෙල්ලම් කරනවා.



ටික කාලයක් මියුල මෙහෙම සතුටින් කල් ගත කලා. එක දවසක් පාසල් ඇරිලා දවල්ට ගෙදර එද්දි මියුල දැක්කා පුංචි ළමයෙක් දියේ ගිලෙනවා. ඒක දැකපු මියුල ඒ වෙලාවෙම ගඟට පැනලා දියේ ගිලුණ පුංචි ළමයව බේර ගත්තා. මේ නිසා මියුල මුළු ගමේම වීරයෙක් හැටියට ප්‍රසිද්ධ වුණා.  ගමේ හිටපු ගොඩක් අය හිතනවා මෙච්චර දෙයක් කරන්න පුළුවන් වුණේ මේ රෝද පුටුවේ හිටිය ළමයටද කියලා........



මියුලට දැන් ගොඩක් අය කතා කරන්නේ "අපේ ගමේ පුංචි වීරයා" කියලා. මේ නිසා මියුලගේ අම්මාත්, තාත්තාත් ගොඩක් ආඩම්බර වුණා.

මියුලට මේ තැනට එන්න පුළුවන් වුණේ එයාගේ තිබුණ ධෛර්යයවන්තකමත්, නිර්භීතකමත් හා කැපවීමත් නිසාමයි. අපිත් මියුල වගේ උත්සාහවන්ත වුණොත් කරන්න බැරි දෙයක් නෑ.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,<br>
සෙනෙවිරත්න මහලේකම්